Major Accept

ID 437

# මඟුල් තහංචි සංකල්පය හා ග්‍රාමීය ජන සමාජය

තාවකාලික සහකාර කථිකාචාර්ය, මහේෂි සමරවික්‍රම
පුරාවිද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව
msarchi92@gmail.com

ආදිකාලීන ගෝත්‍රික ජනතාව විසින් සිය ගෝත්‍රික සමූහයේ කාන්තාවක් පැහැර ගැනීමට පැමිණි අවස්ථාවකදී එම ස්ත්‍රිය පැහැරගෙන යාම වළක්වමින් පැමිණි පිරිස් සමඟ සටන් කිරීම දැකිය හැකිය. මෙහිදී ද නිතරගයෙන් ජයග්‍රහණය කරනු ලබන්නේ , කාන්තාව පැහැරගෙන යාමට පැමිණි පිරිස විසින් වේ. ගෝත්‍රික සංකල්ප අවස්ථාවේ සිට ක්‍රමයෙන් විකාශය වෙමින් ආ චාරිත්‍රයක් ලෙසින් මඟුල් තහංචි පැනවීම හා මඟුල් තහංචි ජන ගායනා පෙන්වාදිය හැකිය. ජන කවි සම්ප්‍රදායේ හමුවන මඟුල් තහංචි කවි ලෙසින් සැලකෙන ජන කවි රාශියක් ජන සමාජයේ දැකිය හැකිවේ. යුවලක් විවාහ දිවියට පා තබන අවස්ථාවේදී මනමාලයා විසින් මනමාලියගේ නිවසට පැමිණීමේ දී කඩුල්ලේ සිට පෝරුව දක්වා අනුක්‍රමයෙන් මනමාලියගේ ඥාතීන් විසින් තහංචි කවි කීමෙන් තහනම් කරනු ලැබේ. මෙම තහංචි කවි ගායනා කිරීමේ දී මනමාලයාගේ පාර්ශවයෙන් ද මෙම මඟුල් තහංචි අහෝසි වන ආකාරයෙන් නැවත මඟුල් තහංචි කවි ගායනා කරන අවස්ථා දැකිය හැකිවේ. මනමාලයා මඟුල් ගෙදර කඩුල්ලය වෙත ළඟා වන විටද , මඟුල් පාවඩය මත මොහොතේ දීද , මඟුල් මඩුවට පිවිසෙන අවස්ථාවේ දීද , මඟුල් බුලත් ලබන අවස්ථාවේදී ද , මංගල පහන දල්වන විට හා පෝරු මණ්ඩපයට පිවිසෙන මොහොතේදී ද මෙම තහංචි කවි ගායනා කරනු ලැබේ. තවද මංගල්‍යය පවත්වනු ලබන නිවසෙහි පවතින සියලු උපකරණයන් පරිහරණය කිරීම මනාල පාර්ශවයට තහනම් වන අතර මේ සඳහා ප්‍රීති තහංචි කවි ගායනා කිරීමෙන් භාණ්ඩ පරිහරණය සඳහා අවසර ලබා ගැනීම සිදුකෙරේ. මෙම පර්යේෂණය හරහා මෙම මඟුල් තහංචි ජන කවි ගායනා ඇසුරින් මඟුල් තහංචි පැනවීමේ සංකල්පය පිළිබඳව අධ්‍යයන කරනු ලැබේ. තවද මෙම පර්යේෂණයේ දී පර්යේෂණ සීමාව ලෙසින් මඟුල් තහංචි ජන කවි මත පදනම්ව මඟුල් තහංචි සංකල්පය අධ්‍යයනය කරනු ලැබේ. මෙම පර්යේෂණයෙහි පර්යේෂණ අරමුණ වශයෙන් අභාවයට යමින් පවතින අතිපැරණි චාරිත්‍රයක් වන මෙම මඟුල් තහංචි සංකල්පය හා මේ ඇසුරින් නිර්මාණය වී ඇති අස්පර්ශිත සංස්කෘතිය පිළිබඳව ප්‍රමාණාත්මක අධ්‍යයනයක් සිදුකිරීම හා අස්පර්ශිත සංස්කෘතිකය යටතේ මෙම සංකල්පයන් ජනසතු කිරීම හා ආරක්ෂා කිරීම සඳහා ක්‍රමාවලියක් ඉදිරිපත් කිරීම මෙහි අරමුණ විය. ග්‍රාමීය ජන ජීවිතයේ සරලත්වය හා සාම්ප්‍රදායික ගතික ස්වභාවයන් නිරූපණය කෙරෙන මෙම සංකල්පයන් පිළිබඳ අනාගත මතු පරපුර වෙත රසවින්දනය කිරීම සඳහා සංරක්ෂණය කිරීම කළයුතු හා සංස්කෘතික උරුමයන් ආශ්‍රේය කරගනිමින් පමණක් නොව අස්පර්ශිත සංස්කෘතික උරුමයන් හරහාද කෞතුකාගාර වෙත ජනතාව ඇදා ගැනීමට හැකිබව මෙම පර්යේෂණයේ සමාලෝචනය වශයෙන් පෙන්වා දියහැකි වේ.

ප්‍රමුඛ පද - තහංචි , ජන සමාජය , අස්පර්ශිත සංස්කෘතිය , විවාහය , ජන කවි

- පර්යේෂණ ක්‍රමවේදය ඇතුලත් නොවේ.
- ප්‍රතිඵල ඇතුලත් නොවේ.
- පර්යේෂණ අරමුණු කෙටියෙන් පැහැදිලිව දක්වන්න
- අරමුණුවට ගැලපෙන ලෙස නිගමන දක්වමින් ප්‍රතිඵල ඇතුලත්කරන්න